**තවලම ප්‍රාදේශීය සභාව**
**ගාල්ල දිස්ත්‍රික්කය**
-------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 31 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 27 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 අගෝස්තු 31 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

## 1.2 මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට තවලම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කර්මාන්ත 04 ක් සඳහා සමාලෝචිත වර්ෂය වෙනුවෙන් රු.220,000 ක ප්‍රාග්ධන ආධාර හා ගෙවිය යුතු ප්‍රාග්ධන වැය වශයෙන් ප්‍රතිපාදන නොසැලසීම නිසා සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන ආධාර, ප්‍රාග්ධන වැය, ණයගැතියන් හා ණයහිමියන් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දැක්විණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළදී සභාවට ලැබුණු රු.684,367 ක වත්කම් ප්‍රාග්ධන ආධාර ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළදී පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශයෙන් සභාවට ලැබී තිබූ රු.6,390,000 ක් වටිනා ඩබල් කැබ් රථය මූල්‍ය ප්‍රකාශනවලින් අත්හැරී තිබුණි.

(ඈ) ප්‍රාග්ධන වත්කම් මිළදී ගැනීම සඳහා හා ප්‍රාග්ධන වත්කම් වැඩිදියුණු කිරීම සඳහා වැයකර තිබූ රු.1,335,200 ක මුදල පුනරාවර්තන වියදම් යටතේ දැක්වීමෙන් පුනරාවර්තන වියදම් හා ප්‍රාග්ධන වියදම් පිළිවෙලින් රු.1,335,200 බැගින් වැඩියෙන් හා අඩුවෙන් දැක්විණි.

(ඉ) සමාලෝචිත වර්ෂය තුළදී මිලදී ගෙන තිබූ රු.694,060 ක් වටිනා ස්ථාවර වත්කම් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය තුළදී නිම නොවූ කර්මාන්ත සඳහා ගෙවා ඇති රු.1,482,000 ක අත්තිකාරම් මුදල් මූල්‍ය ප්‍රකාශනවල නොපියවූ අත්තිකාරම් ලෙස නොදක්වා ප්‍රාග්ධන වැය ලෙස දක්වා තිබුණි.

(උ) 1994, 2009, 2010 හා 2013 වර්ෂවල හිඟ විගණන ගාස්තු ලෙස විගණකාධිපතිවරයාට ගෙවිය යුතු පිළිවෙලින් රු.16,250, රු.40,356, රු.39,648 හා රු.47,712 ක් වශයෙන් රු.143,966 ක මුදලක් හා සමාලෝචිත වර්ෂයේ විගණන ගාස්තු සඳහා ද ප්‍රතිපාදන සළසා නොතිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂය සඳහා ලැබිය යුතු උසාවි දඩ ආදායම රු.183,499 ක් වුවත්, මූල්‍ය ප්‍රකාශනවල රු.216,061 ක් ලෙස දැක්වීමෙන් සමාලෝචිත වර්ෂයේ දඩ හා වරෙන්තු ගාස්තු ආදායම හා ආදායම් ණයගැතියෝ රු.32,562 බැගින් වැඩියෙන් දැක්විණි.

(එ) ඉකුත් වර්ෂයේ ලැබිය යුතු හිඟ මුද්දර ගාස්තු ආදායම රු.957,440 ක් වුවත්, මූල්‍ය ප්‍රකාශනවල රු.600,000 ක් ලෙස ප්‍රතිපාදනය කිරීමෙන් මූල්‍ය ප්‍රකාශනවල සමුච්චිත අරමුදල් හා ආදායම් ණයගැතියෝ රු.357,440 බැගින් අඩුවෙන් දැක්විණි.

(ඒ) සභාව සතු ස්ථාවර වත්කම් යටතට නොගැනෙන රු.115,716 ක් වටිනා ඉන්වෙන්ට්‍රි භාණ්ඩ ස්ථාවර වත්කම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමෙන් ස්ථාවර වත්කම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දැක්විණි.

### 1.3.2 අවිනිශ්චිත ගිණුම්

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වූ රු.18,448 ක අවිනිශ්චිත ගිණුම් හර ශේෂය හඳුනාගෙන ගැලපීම් කිරීමට කටයුතු කර නොතිබුණි.

### 1.3.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ එකතුව රු.72,328,952 ක් වූ ගනුදෙනු සම්බන්ධව යාවත්කාලීනව පවත්වාගෙන ගොස් තිබුණු ස්ථාවර වත්කම් ලේඛනය, සමීක්ෂණ මණ්ඩල වාර්තා, ණයහිමි ලේඛනය, ණයගැති ලේඛනය, කාලවිශ්ලේෂණය හා ශේෂ තහවුරු ලිපි පිළිබඳ සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරිණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.1,129,676 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.379,708 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

---------------------

### 2.2.1 අක්කර බදු

------------

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂවලට අදාළව අයකර ගත යුතුව තිබූ රු.79,109 ක් වූ අක්කර බදු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158(1)(අ) වගන්තිය ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 2.2.2 බදු කුලී

--------

(i) සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂවලට අදාළව අයකර ගත යුතුව තිබූ රු67,000. ක් වූ බදු කුලී කාරව අයකර ගැනීමට කටයුතු කරවගන්තිය ප්‍ර (1)159 දේශීය සභා පනතේදරන ප්‍රා 15 අංක 1987 නොතිබුණි.

මාස 06 කට වඩා බදු නොගෙවූ කඩ කාමර බදුකරුවන් 5 දෙනෙකුගෙන් 2014 දෙසැම්බර් 31 දින රු.60,200 ක් වූ හිඟ කඩකාමර බදු කුලී හා දඩ මුදල් ආදායමක් අයවීමට පැවතිය ද, කඩ බදු ගිවිසුමේ කොන්දේසි ප්‍රකාරව ක්‍රියා කිරීමට සභා ලේකම් විසින් කටයුතු කර නොතිබුණි.

(ii) දකුණු පලාත්, පළාත් පාලන කොමසාරිස්ගේ **2010** දෙසැම්බර් **27** දිනැති අංක : දපසං/පපාකො/**2010/ 01** දරන චක්‍රලේඛයෙහි **5** වන ඡේදය ප්‍රකාරව යටත් පිරිසෙයින් වසර **05** කට වරක් තක්සේරු කර ඒ අනුව කඩකුලී අය කළයුතු වුවත්, බදු ගිවිසුම් නොමැතිව / යාවත්කාලීන නොකර, කඩ කාමර **12** ක් පවත්වාගෙන යමින් පැවතුනි. සභාව වෙත ප්‍රධාන තක්සේරුකරුගේ **2014** ජූලි **16** දිනැති අංක **GL-11/RP/2154** දරන ලිපියෙන් තක්සේරු වටිනාකම් දක්වා තිබියදීත් සභාව විසින් ඒ අනුව කඩකුලී අයකිරීමට කටයුතු නොකර, වර්ෂ **09** කට පෙර තක්සේරු බදු මුදල් අයකිරීම නිසා සභාවට රු.**90,800** ක පාඩු සිදු වී තිබුණි.

(iii) සභාවට අයත් බටහේන දෙමහල් වෙළඳ සංකීර්ණයේ කඩ කාමර **08** කින් අය වියයුතු රු.**538,000** ක මුදල වර්ෂ **10** ක් ගත වී ඇතත්, අයකර ගැනීමට සභා ලේකම් විසින් කටයුතු කර නොතිබුණි.

### 2.2.3 බලපත්‍ර ගාස්තු

-----------------

බලපත්‍ර ගාස්තු හා ව්‍යාපාර බදු අයකළයුතු ව්‍යාපාර ආයතන පිළිබඳ 2014 වර්ෂය වෙනුවෙන් වාර්ෂික සමීක්ෂණය සිදුකර නොතිබුණි. 2014 දෙසැම්බර් 31 දිනට ව්‍යාපාර ආයතන 226 කින් රු.274,550 ක හිඟ ව්‍යාපාර බදු හා වෙළඳ බලපත්‍ර ගාස්තු පැවතිය ද, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152(4) වගන්තිය ප්‍රකාරව හිඟ අයකර ගැනීමට සභා ලේකම්වරයා විසින් කටයුතු කර නොතිබුණි.

### 2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

------------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2014 දෙසැම්බර් 31 දිනට රු.469,936ක උසාවි දඩ හා රු.1,850,000 ක් වූ මුද්දර ගාස්තු ලැබිය යුතුව තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 බලය නොළත් ගනුදෙනු**

**(අ)** කර්මාන්ත සඳහා බැකෝ යන්ත්‍රයක් යොදා ගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම.

ඉකුත් වර්ෂයන්හි දී කර්මාන්ත හතරක් වෙනුවෙන් බැකෝ යන්ත්‍රයක් පැය 239 ක් යොදා ගැනීම වෙනුවෙන් 2014 වර්ෂය තුළදී සභා අරමුදලින් රු.286,800 ක් ගෙවා තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) එක් එක් කර්මාන්තය වෙනුවෙන් ඇස්තමේන්තු සකස් කර සහා අනුමැතියක් ලබාගෙන නොතිබුණි.

(ii) 2012 සහ 2013 වර්ෂයන් තුළ කර්මාන්ත ඉටුකළ බවට බැකෝ යන්ත්‍ර අයිතිකරු බිල්පත් ඉදිරිපත් කර තිබුණ ද, එම බිල්පත් එකී කාලපරිච්ඡේදයන් තුළ සභාවේ සේවය කරන ලද තාක්ෂණ සේවා නිලධාරී / නිලධාරීන් විසින් නිර්දේශ කර නොතිබුණි. එසේ වුවද අදාල බිල්පත් 04 නිසි වෘත්තීය සැලකිල්ලක් නොදක්වා සභාවේ දැනට සේවයේ නියුතු තාක්ෂණ සේවා නිලධාරිවරයා විසින් 2014 මාර්තු 03 දින දී නිර්දේශ කර තිබුණි.

(iii) බැකෝ යන්ත්‍රය කුලියට ගැනීම සම්බන්ධයෙන් මිළ ගණන් කැඳවීමක් කර නොතිබුණි.

(iv) සභාව විසින් කර්මාන්තවලට අදාලව ලිපිගොනු පවත්වා නොතිබුණි.

(v) මෙම ගෙවීම් සම්බන්ධයෙන් ඉකුත් වර්ෂයන්හි දී ණයහිමි ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ආ) උත්සව වියදම්

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132(ඒ) වගන්තිය අනුව පොදු වැදගත්කමකින් යුත් කාර්යයන් පිළිබඳ උත්සව වියදම් සම්බන්ධයෙන් එක් වර්ෂයකට මුළු එකතුව රුපියල් එක් දහසක් නොඉක්මවන පරිදි වියයුතු අතර, එය ඉක්මවන විට ඒ සඳහා අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ලියවිල්ලකින් ලබා ගත යුතුය. එහෙත් සභාව විසින් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා නොගෙන 2014 වර්ෂය තුලදී රු.182,621 ක් සභා අරමුදලින් වැයකර තිබුණි.

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

**වත්කම් හා බැරකම් ප්‍රකාශ ලබා නොදීම**

1988 අංක 74 දරන (සංශෝධන) පනතින් සංශෝධිත 1975 අංක 01 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනතේ අවශ්‍යතාවයන් අනුව සභාපති, උප සභාපති ඇතුළු සියළුම සභිකයින් විසින් වත්කම් හා බැරකම් ප්‍රකාශ ලබා දියයුතු වුවත්, සභාවේ සභාපති, උප සභාපති හා සභිකයින් 07 දෙනා විසින් 2015 අප්‍රේල් 10 දින වන විටත් 2011 සිට 2014 වර්ෂය දක්වා වූ වත්කම් හා බැරකම් ප්‍රකාශ ලබා දී නොතිබුණි.

**3.3 විදුලිජනන යන්ත්‍රයක් මිළදී ගැනීම**

----------------------------------------

2014 අයවැය යෝජනා ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ ජාතික වැඩ සටහන යටතේ සභාව විසින් රු.999,990 ක් වැයකර ආදාහනාගාරය සඳහා විදුලි ජනන යන්ත්‍රයක් මිලදී ගෙන තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) විදුලි ජනන යන්ත්‍රය මිලදී ගැනීම සම්බන්ධව පිරිවිතර සකස් කර නොතිබුණි.

(ii) ඉදිරිපත් කර තිබූ මිල ගණන් විවෘත මිල කැඳවීම යටතේ ලැබූ මිල ගණන් ද යන්න තහවුරු නොවූ අතර, ලැබී තිබූ මිල ගණන් සඳහා දින මුද්‍රා යොදා නොතිබුණි.

(iii) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 177 හා 178 ප්‍රකාරව මිලදී ගැනීම සභාවට හෝ මුදල් කමිටුවට යොමුකළ බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය. මේ අනුව ඉදිරිපත් කරන ලද මිල ගණන් තාක්ෂණ ඇගයීම් කමිටුවක් වෙත යොමුකර නිර්දේශ ලබා ගැනීමක් ද සිදුව නොතිබුණි.

(iv) සභාව සැපයුම්කරු සමඟ ගිවිසුමකට එළඹ නොතිබුණි.

(v) මිල කැඳවීමට අනුව සභාව විසින් ඉල්ලුම් කර තිබුණේ ජපානයේ හෝ එංගලන්තයේ නිෂ්පාදිත කිලෝවොට් 10 (10kv) ට වඩා වැඩි විදුලි ජනන යන්ත්‍රයක් වුවත්, සභාව විසින් චීනයේ නිෂ්පාදිත කිලෝවොට් 10 (10kv) ක විදුලි ජනන යන්ත්‍රයක් මිලදී ගෙන තිබුණි.

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

------------------------------------------

**අයවැය පාලනය**

-------------------

අයවැය ලේඛනයෙහි ඇස්තමේන්තුගත සහ තථ්‍ය වශයෙන් ලැබූ ආදායම් අතර විචලනයන් පවතින බවත්, ඇතැම් වියදම් විෂයයන්වල ඉතිරි කිරීම් තිබූ බවත් නිරීක්ෂණය විය. ඒ අනුව අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් ලෙස යොදාගෙන ඇති බවක් නිරීක්ෂණය නොවුණි.

**5. පද්ධති හා පාලනය**

---------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) වත්කම් කළමනාකරණය